# උතුරු පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ගණයේ (නුපුහුණු) කම්කරු III වන ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවීම – 2019

උතුරු පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ගණයේ (නුපුහුණු) කම්කරු තනතුරට, 1 වන ලේඛනයේ සඳහන් පරිදි පවතින තනතුරු පුරප්පාඩු 54 ක් සඳහා බඳවා ගැනීමට උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම දැන්වීමේ සඳහන් පරිදි අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය වනුයේ 04.10.2019 වන දින වේ.

2. බඳවා ගැනීමේ සේවා කොන්දේසීන් :

2.1 2019.08.26 වැනි දින සිට ක්‍රියාත්මකව පවතින උතුරු පළාත් දෙපාර්තමේන්තු සේවයේ ප්‍රාථමික ගණයේ (නුපුහුණු) කම්කරු තනතුරට අදාළ සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ නිර්දිෂ්ට කොන්දේසීන් හා උතුරු පළාත් ගරු ආණ්ඩුකාරවරගේ අංක G/NPC/A9/Agri/Approval/2019 දරණ 2019.09.12 දිනැති ලිපිය මඟින් වූ අනුමැතිය පරිදි ද, ආයතන සංග්‍රහයේ විධිවිධානයන් පරිදි ද, මුදල් රෙගුලාසීන් හා ශ්‍රීලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ අංක 1817/30 දරණ 2013.07.03 වැනි දින දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද උතුරු පළාත් රාජ්‍ය සේවයට අයත් ආයතන පටිපාටි සංග්‍රහය යනාදියටත් මතු පැමිණෙන කාලයන් හි මෙහි ඇති කරනු ලබන කිසියම් සංශෝධනයන්ට ද අනුකූලව තෝරා ගන්නා අයදුම්කරුවන් ප්‍රාථමික ගණයේ (නුපුහුණු) කම්කරු III වන ශ්‍රේණියේ තනතුරු ගණයට අයත්, දැන්වීමේ 1 වන ලේඛනයේ සඳහන් පරිදි අයදුම්කරුවන් විසින් අයදුම්කරන තනතුරට පත් කරනු ලැබේ. තනතුරු පිළිබඳ විස්තර 1 වන ලේඛනයේ දක්වා ඇත.

2.2 සම්මුඛ පරීක්ෂණය මඟින් පත්වීම සඳහා තෝරා ගන්නා අයදුම්කරුවන් පත්වීම් ලද දින සිට වසර තුනක් (03) පරිවාස කාලයකට යටත් කර ප්‍රාථමික ගණයේ (නුපුහුණු) III වන ශ්‍රේණියේ තනතුරට පත් කරනු ලැබේ. මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් හිමි තනතුරකි. සේවා ව්‍යාවස්ථා සංග්‍රහයේ සඳහන් වන ප්‍රාථමික ගණයේ (නුපුහුණු) කම්කරු, III වන ශ්‍රේණියේ තනතුරට පත් කරනු ලබන දින සිට වසර තුනක් (03) අවසන් වීමට ප්‍රථම පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් විය යුතුයි.

2.3 මෙම සේවය ස්ථාන මාරුවීම් වලට යටත් වූ සේවාවක් වේ. මෙම තනතුරට පත් කරනු ලබන අයදුම්කරුවන් උතුරු පළාතේ කුමණ ප්‍රදේශයක වුවද සේවය කළ යුතුයි යන නියෝගයට අවනත විය යුතුයි.

2.4 එක් සේවා ස්ථානයකින් පත්වීම් ලබන්නන්, එම සේවා ස්ථානයේ ම අඛණ්ඩව වසර පහක් (05) අනිවාර්‍යයෙන් ම සේවය කළ යුතුයි.

2.5 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හා මේ සම්බන්ධයෙන් හා ඉන් පසුව නිකුත් කරනු ලබන චක්‍රලේඛ ප්‍රකාර වසර පහක් (05) ක් ගතවීමට ප්‍රථම නියම කර ඇති දෙවන රාජ්‍ය භාෂා හැකියාවෙන් සමත් විය යුතුයි.

2.6 පත්වීම් සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය යනාදි කරුණු පත්වීම් බලධාරියා විසින් නිර්වචනය කරනු ලැබේ. කෙසේ වුවද දන්වා ඇති පුරප්පාඩු සම්බන්ධයෙන් යම්

පුරප්පාඩු හෝ පුරප්පාඩු සියල්ල පූර්ණය නොකර සිටීමේ බලය පත්වීම් බලධාරියා සතුව ඇත.

2.7 (1 වන වගුව) දිස්ත්‍රික් මට්ටමේ සත්ව නිෂ්පාදනය හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ පවතින තනතුරු පුරප්පාඩු වල තොරතුරු

| **දෙපාර්තමේන්තුව** | **තනතුරු** | **යාපනය** | **කිලිනොච්චිය** | **මුලතිව්** | **වවුනියාව** | **මන්නාරම** | **මුළු ගණන** |
|---|---|---|---|---|---|---|---|
| කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | ජල පොම්ප ක්‍රියාකරු | - | ✔ | - | ✔ | - | 02 |
| | දෙපාර්තමේන්තු කම්කරු | ✔ | ✔ | ✔ | ✔ | ✔ | 52 |
| මුළු ගණන | | | | | | | 54 |

2.8 පළමු වගුවේ දක්වා ඇති තනතුරු වලට අදාළ රාජකාරි සම්බන්ධ වගකීම් විස්තර

**ජල පොම්ප ක්‍රියාකරු තනතුරට අදාළ රාජකාරීන් හා වගකීම්**

- නියමිත ආකාරයට ජල පොම්ප ක්‍රියාත්මක කිරීම.
- ක්ෂුද්‍ර වාරිමාර්ග සම්බන්ධ කාර්යයට සහය වීම හා පවත්වාගෙන යාම.
- යන්ත්‍රෝපකරණ වල ඇති වන දෝෂ සඳහා කුඩා ප්‍රමාණයේ අලුත්වැඩියාවන් හි නියැලීම

**දෙපාර්තමේන්තු කම්කරු තනතුරට අදාළ රාජකාරීන් හා වගකීම්**

- කෘෂි ගොවිපළ හා පුහුණු මධ්‍යස්ථාන වල බෝග වගාවන් සඳහා ඉඩම් සකස් කිරීම, වල් පැලැටි ඉවත් කිරීම, වතුර දැමීමල පොහොර දැමීම, වල් නාශක ඉසීම.
- අදාළ කාලවලදී කෘෂි නිෂ්පාදන බෝග නිසි වෙලාවට කපා ගැනීම, පිරිසිදු කිරීම, හා තත්ව ශ්‍රේණිගත කිරීම, අලෙවිය සඳහා ප්‍රවාහන කිරීම හා ගබඩා කිරීම
- කෘෂි භාණ්ඩ හා උපකරණ හා යන්ත්‍ර ක්‍රියාත්මක කර ගොවිපළ කටයුතු කිරීම නඩත්තුව
- බීජ පැල සැකසීම ප්‍රමිති සහගත බීජ පැල නිෂ්පාදනය කිරීම.
- කෘෂි ප්‍රදර්ශන, ජංගම සේවය, කෘෂි පුහුණු පන්ති වැනි වැඩසටහන් වලට අදාල ක්ෂේත්‍ර කටයුතු කිරීම.
- වාහන මඟින් කෘෂිකාර්මික යෙදවුම් ප්‍රවාහන කිරීම
- ගොවිපළ අවට පරිසරය සුද්ධ කිරීම හා අලංකාර කිරීම
- පළතුරු ගස් හා විසිතුරු ශාක හිටවීම හා නඩත්තු කිරීම

- බිම්මල් නිෂ්පාදනය, මී මැසි පාලනය, ඒකාබද්ධ වූ ගොවිපළවල් වැනි විශේෂ කටයුතු සකස් කිරීම

**3. වැටුප් පරිමාණය හා වැටුප් කේතය :**

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 පරිදි, වැටුප් කාණ්ඩය **PL 1 - 2016 පරිදි දෙපාර්තමේන්තු සේවය සඳහා වූ ප්‍රථමික (නුපුහුණු) ගණයේ කම්කරු** III වන ශ්‍රේණියට අදාළ ඒකාබද්ධ වැටුප් අනුපාතය රු. **24,250 – 10 x 250 - 10 x 270 - 10 x 300 – 12x330 - 36,410/-** ක් වේ. (රුපියල් 25,000 ක් වන වැටුප් පියවරට එළඹීමට ප්‍රථම පළමු කාර්යක්ෂමතා කඩඉම සමත්වීම අනිවාර්ය වේ) කෙසේ වුව ද ඉහත චක්‍රලේඛයේ **II වන වගුවේ** සඳහන් කර ඇති විධිවිධානයන්ට අනුකූලව වැටුප් ගෙවනු ලැබේ.

**4. සාමාන්‍ය සුදුසුකම්**

04.1 අයදුම්කරු ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුයි.

04.2 අයදුම්කරු උතුරු පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට යෝග්‍ය වන පරිදි ශාරීරික වශයෙන් නිරෝගී පුද්ගලයන් විය යුතු අතර මනා චරිතයකින් හෙබි පුද්ගලයෙකු විය යුතුයි.

04.3 අයදුම්කරු උතුරු පළාතේ ස්ථිර පදිංචිකරුවකු විය යුතුයි. මෙම අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට ප්‍රථම අවම වශයෙන වසර තුනක් (03) උතුරු පළාතේ අඛණ්ඩ පදිංචිකරුවෙකු විය යුතුයි. ( ස්ථිර පදිංචිය තහවුරු කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් විසින් නිර්දේශ කරන ලදුව ග්‍රාම සේවක නිලධාරි විසින් නිකුත් කළ සහතිකයක් හෝ චන්ද හිමි නාම ලේඛණයෙන් උපුටා ගන්නා ලද පිටපතක් ඉදිරිපත් කළ යුතුයි)

04.4 අයදුම්පත භාර ගන්නා අවසන් දිනට හෝ ඊට ප්‍රථම මෙම තනතුර සඳහා කැඳවන ලද **සියළුම සුදුසුකම්** අයදුම්කරු විසින් සපුරා තිබිය යුතුයි.

**05. අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම් :-**

5.1 **අධ්‍යාපන සුදුසුකම් :-**

8 වන ශ්‍රේණිය හෝ වසර නවය (9) සමත්වී තිබිය යුතුයි.

**5.2 අත්දැකීම් :** අදාළ තනතුරු වලට ලබා ඇති අත්දැකීම් අමතර සුදුසුකම් වශයෙන් සැලකිල්ලට ගනු ලැබේ

**5.3 වයස් සීමාව :**

අයදුම්පත භාරගන්නා අවසාන දිනට අයදුම්කරු අවුරුදු දහ අටට (18) නොඅඩු හා වයස අවුරුදු හතලිස් පහට (45) නොවැඩි අය විය යුතුයි

**06 බඳවා ගැනීමේ පටිපාටින් :-**

06.1 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය මඟින් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය මඟින්, බඳවා ගැනීමේ කටයුතු ක්‍රියාත්මක කරන අතර ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී දිස්ත්‍රික් මට්ටමින් අයදුම්කරුවන් ලබා ගන්නා ලකුණු වල ප්‍රමුඛතාවය අනුව දිස්ත්‍රික්කයේ

පවතින අවස්ථාවේදී ප්‍රතිපත්ති (නුපුහුණු) කැඳවා අවශ්‍ය අහෝසි හා පුරප්පාඩු වලට සරිලන පරිදි පත්වීම් ප්‍රදානය කරනු ලැබේ, බඳවා ගන්නා බලගත්වා ඇති චක්‍රලේඛ, බඳවා ගැනීමේ පටිපාටීන් හා ජාතික හා පළාත් යනාදී කරුණුවලට එකඟව **දෙපාර්තමේන්තු සේවයට අදාළ ප්‍රාථමික ගණයේ කම්කරු III වන ශ්‍රේණියේ** තනතුරට බඳවා ගනු ලැබේ. මෙම දැන්වීම මඟින් ඇති සුදුසුකම් සියල්ල සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේ දී පරීක්ෂා කරනු ලැබේ. සුදුසුකම් නැති බවට අනාවරණය වූ විට මෙම තනතුරු සඳහා ඇති හිමිකම් කරනු ලැබේ. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේ දී කැඳවන ලද සියලුම සුදුසුකම් ලියකියවිලි පරීක්ෂාවට ලක් කරන අතර මේ සඳහා ලකුණු කිසිවක් ප්‍රදානය කරනු නොලැබේ.

06.2 පුරප්පාඩුවලින් 03% ක් විශේෂ අවශ්‍යතා ඇති අයදුම්කරුවන් සඳහා (ආබාධිත) වෙන්කරනු ලැබේ. අදාළ අයදුම්කරු පත්වීම සඳහා තෝරා ගන්නා විට එම තනතුරේ සේවය කිරීමට තම විශේෂිත අවශ්‍යතා තත්වය බාධාවක් නොවන බව විශේෂ වෛද්‍ය පරීක්ෂණය මඟින් ඔප්පු කළ යුතුයි. කෙසේ වුවද විශේෂ අවශ්‍යතාවය ඇති අයදුම්කරුවන් පත්වීම සඳහා සුදුසුකම් ලබන්නේ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් සමත්වීමට අවශ්‍ය ලකුණු ප්‍රමාණයක් ලබා ගන්නා පදනම මතයි

## 07 අයදුම්කරන ක්‍රමය :-

07.1 මෙම දැනවීම අවසානයේ ඇති ආදර්ශ අයදුම්පතට අනුකූලව A4 ප්‍රමාණයේ (21 සෙ.මී x 29 සෙ.මී) කඩදාසියක 1 සිට 10 දක්වා තිබෙන ජේද පළමු පිටුවෙ ද, 11 සිට 14 දක්වා තිබෙන ජේද දෙවන පිටුවේ ද, ආවරණය වන පරිදි අයදුම්පත සකස් කර ගත යුතුයි. සම්පූර්ණ කරන ලද අයදුම්පත **04.10.2019** වැනි දිනට හෝ ර්ට ප්‍රථම ලැබෙන පරිදි, **"ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත, අංක: 393/48, කෝවිල් වීදිය, නල්ලූර්, යාපනය"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුයි.

**සටහන :** අයදුම්කරු විසින් එක තනතුරකට වඩා වැඩි තනතුරු වලට අයදුම් කිරීමට මනාප නම් එක් එක් තනතුරු සඳහා වෙන වෙනම අයදුම්පත් යොමු කළ යුතුය.

**07.2** අයදුම්පත / අයදුම්පත් යොමු කරන ලිපිකවරයේ වම් ඉහළ කෙළවරේ **"උතුරු පළාත්** කෘෂිකර්ම දෙපාර්තමේන්තු සේවයේ **ප්‍රාථමික ගණයේ (නුපුහුණු) කම්කරු, (දිස්ත්‍රික්කය) (තනතුරේ නම) III වන ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීමේ අයදුම්පත්‍රය – 2019"** යනුවෙන් සඳහන් කළ යුතුයි. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් හා, අවශ්‍ය තොරතුරු සම්පූර්ණ කර නැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**07.3** අයදුම්පතේ ඡායා පිටපත ඔබ භාරයේ තබා ගැනීම ප්‍රයෝජනවත් වන අතර අයදුම්පතේ ඡායා පිටපත් හෝ පූර්ව නිශ්චිත පිටපත් යනාදීන් භාරගනු නොලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා වන කැඳවීම් ලිපිය කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම් විසින් නිකුත් කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම් ලිපිය **නිකුත් කිරීම යනු අයදුම්කරු විසින් සියළුම සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් සේ නොසැළකිය යුතුයි.**

**07.4** සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම් ලිපියක් ලැබුණේ නැති නම්, ඒ පිළිබඳ පහත සඳහන් තොරතුරු සමඟ, **"ලේකම්, කෘෂි කර්ම අමාත්‍යාංශය, උතුරු පළාත, අංක: 655,**

**තාවලර් පාර, යාපනය" යන ලිපිනයට දැන්විය යුතුයි ( 021 221 7306 දුරකථන අංකය) පැක්ස් අංකය 021 221 7304.**

**සටහන :** අයදුම්කරු විසින් සකස් කරන ලද ආවරණ ලිපියක් අයදුම්පතේ ඡායා පිටපතක් හා ලියාපදිංචි තැපැල් කුවිතාන්සියේ පිටපතක්

**8. අසත්‍ය තොරතුරු සඳහා දඬුවම :-**

අයදුම්පත් සම්පූර්ණ කරන විට ඉතා අවධානයෙන් යුතුව සත්‍ය තොරතුරු ඉදිරිපත් කිරීමට වගබලා ගත යුතුයි. අයදුම්කරු විසින් ඉදිරිපත් කර ඇති යම්කිසි තොරතුරක් අසත්‍ය බවට ඔප්පු වුවහොත් ඕනෑම අවස්ථාවක එම පුද්ගලයා පළාත් රාජ්‍ය සේවයෙන් පහ කිරීමට කටයුතු කළ හැකිය.

**9. අත්සන සහතික කිරීම :-**

**අයදුම්කරුවන් සියළු දෙනාම තම අත්සන සහතික කරවා ගැනීම අත්‍යාවශ්‍ය වේ.** රජයේ ආයතනයක් මඟින් අයදුම්කරන අයදුම්කරුවකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු වෙනුවට අත්සන් කිරීමට බලයලත් නිලධරයකු මඟින් තම අත්සන සහතික කරවා ගත යුතුයි. අනෙක් අයදුම්කරුවන් තම ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී සාම විනිසුරු, දිවුරුම් නිලධාරී, නීතිඥවරයකු, නොතාරිස්, නාවික හමුදා, යුද හමුදා, ගුවන් හමුදාවන්හි සේවයේ නියුතු නියෝගලත් නිලධාරියකු, රුපියල් 395,520.00 ට නොඅඩු වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ ස්ථිර හෝ පළාත් පාලන හෝ පළාත් නිලධාරියෙකු, ආගමික නිකායන් භාරව කටයුතු කරන පූජක පක්ෂයේ පූජකයකු විසින් සහතික කළ යුතුයි.

10. මෙම සම්මුඛ පරීක්ෂණය පැවැත්වීම හෝ අවලංගු කිරීම සම්බන්ධයෙන් සියළුම බලතල පත්වීම් බලධාරියා වනඋතුරු පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්වරයා සතුය. දෙමළ හා සිංහල මාධ්‍යයන්ගෙන් පළ වන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ වෙනස්කමක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක දෙමළ මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

11. මෙම තනතුරුවලට බඳවා ගැනීම සඳහා වූ ආදර්ශ අයදුම්පත්‍රය www.np.gov.lk යන උතුරු පළාත් සභාවේ වෙබ් අඩවියට පිවිසීමෙන් ලබාගත හැකිය.

***අ. සිවබාලසුන්දරන්***
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
උතුරු පළාත.
14.09.2019